# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
## நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
## MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | 011-2484500<br>011-2484600<br>011-2484700 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2449823 | වෙබ් අඩවිය / இணையதளம் / Website | www.treasury.gov.lk |
| මගේ අංකය / எனது இல / My No | BD/NSLE/103/6/2021 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.06.02 |


ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

<u>**රාජ්‍ය වියදම් පාලනය කිරීම**</u>

මේ වන විට ශ්‍රී ලංකාව අතිශය දරුණු මූල්‍ය අර්බුදයකට මැදිවී සිටී. 2021 වර්ෂය වනවිට මෙරට ආදායමට වඩා වියදම 2.4 ගුණයක් වී ඇත. මෙය රටට ඔරොත්තු නොදෙන තත්ත්වයක් වන අතර ආර්ථික අර්බුදය හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාවට සහන දීමේ තදබල අවශ්‍යතාවයක් ද පවතී. මෙම පසුබිම යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් වන අයවැය චක්‍රලේඛ අංක 03/2022 සහ අංක 22/0508/414/003 දරන 2022.05.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරවමි. යොමුගත චක්‍රලේඛය සහ අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇමුණුම 01 හි සඳහන් වියදම් පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම තුළින් රජය මුහුණ දී ඇති අර්බුදකාරී මූල්‍ය තත්ත්වයන් මනාව කළමනාකරණය කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය අතිශයින් අවශ්‍ය බව කාරුණිකව පෙන්වා දෙමි. ණය හා පොලී ගෙවීම් ඉවත් කළ පසු ජාතික අයවැයෙන් වැඩිම ප්‍රතිපාදනයක් වෙන් වී ඇති අමාත්‍යාංශය ලෙස එහි සඳහන් වියදම් පාලන ක්‍රමවේද ඔබගේ අධීක්ෂණය යටතේ වන ආයතන තුල ක්‍රියාත්මක කිරීම තුලින් වර්තමානයේදී රජය මුහුණ දී ඇති අර්බුදකාරී මූල්‍ය තත්ත්වයන් මනාව කළමනාකරණය කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය අතිශයින් අවශ්‍ය වේ. ඒ සඳහා ඔබ යටතේ ඇති සියලු ආයතන වෙත උපදෙස් ලබා දෙන ලෙසද ඒ පිළිබඳව පසුවිපරම් ක්‍රියාවලියක් පවත්වා ගන්නා ලෙසද කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

02. පවතින අභියෝගාත්මක වාතාවරණය තුල රජයේ ආදායම් වර්ධනය කරගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන නමුත් ඒ සඳහා යම් කාලයක් ගතවන බැවින් එතෙක් රජයේ වියදම් දැරීම පාලනය කිරීම සඳහා විසර්ජන පනතේ 7 වන වගන්තියෙන් මුදල් අමාත්‍යාංශය වෙත පැවරී ඇති බලතල අනුව කලින් බලය දෙනු ලැබූ වියදම් සීමා කිරීමට උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය තුලින් අනුමැතිය ලැබී ඇත.

03. ඉහත සංදර්භය තුල භාණ්ඩාගාරය විසින් ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තු/ආයතනවල 2022 අයවැය පිළිබඳව යළි සලකා බලන ලදී. ඉතික්බිතිව (ඇමුණුම 01 හි සඳහන්) වියදම්/ව්‍යාපෘතිවලට 2022 සඳහා වෙන්වූ ප්‍රතිපාදනවල මෙහි දක්වා ඇති ප්‍රමාණයෙන් අවුරා තැබීමට හඳුනා ගෙන ඇත.

04. විශේෂයෙන් මේ වන විට පවතින අධික මිල ඉහළ යාම, අමුද්‍රව්‍ය හිඟය, විදේශ විනිමය හිඟය හා සමහර ආනයනික භාණ්ඩ සඳහා පනවා ඇති සීමා, අතිවිශාල නොගෙවූ බිල්පත් ප්‍රමාණයක් ගෙවීමට ප්‍රමාණවත් මුදල් හිඟකමක් පැවතීම මෙන්ම රාජ්‍ය වියදම් දැඩි සේ සීමා කිරීමේ අරමුණින් ප්‍රමුඛ නොවන වියදම් අඩු කිරීමට රජය ගෙන ඇති තීරණය ද සැලකිල්ලට ගෙන ඇමුණුම 01 හි සඳහන් අඩුකිරීම්වලට අමතරව, තවදුරටත් වියදම් අඩු කළ හැකි වැය විෂයයක් වේනම් ඒ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

05. තවද ඔබ අමාත්‍යාංශයට අදාල පහත සඳහන් තත්ත්වයන් කෙරෙහිද ඔබගේ සුවිශේෂී අවධානය යොමු කරන මෙන් වැඩි දුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

i. විදේශ විනිමය සම්බන්ධ අර්බුධකාරී තත්ත්වය මත ත්‍රිවිධ හමුදාවන් ඇතුලුව ඔබ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් විදේශ විනිමය භාවිතයෙන් සිදු කළ යුතු බැඳීම්වලට එලඹීමට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ලබා ගන්නා ලද ලිඛිත එකඟතාවය

RECEIVED 05/01/2015 06:49

මිත පමණක් එවැනි බැඳීම්වලට එළඹීමේ අවශ්‍යතාවය පිළිබඳව එම ආයතන වෙත අවධාරණය කිරීම.

ii. එසේම, බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා තිබියදී පවා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල තවදුරටත් සේවක බඳවා ගැනීම් සිදුවන බව වාර්තා වන අතර, එවැනි බඳවා ගැනීම් සිදු කිරීම අත්හිටුවන ලෙස කාරුණිකව දන්වමි. එසේ බඳවා ගැනීම් සිදුකළ හොත් ඒ සඳහා අවශ්‍ය වියදම් සඳහා වන ප්‍රතිපාදන ලබා දීමට භාණ්ඩාගාරයට හැකියාවක් නොමැති බව මෙහිලා වැඩිදුරටත් අවධාරණය කරමි.

iii. මූ.රෙ. 53 යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට නම් එම ඉඩම් අත්පත් කර ගැනීම අනුමත ව්‍යාපෘතියක් සඳහා විය යුතුවේ. එබැවින්, ආරක්ෂක විශයෙන් ඉතාම වැදගත් බවට ආරක්ෂක මණ්ඩලය හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමැතිය ලබා දීම අත්‍යවශ්‍ය යැයි තීරණය කරනු ලබන දැනටමත් කඳවුරු පිහිටා ඇති ඉඩම් හෝ ගොඩනැගිලිවල හෝ කාලයක සිට යම් පොදු කටයුත්තකට යොදාගත් ඉඩම් සම්බන්ධයෙන් අනවසර නියමානුකූල කිරීම සඳහා වන ඉල්ලීමක් නොවන සෑම විටම මූ.රෙ. 53 අනුමැතිය ඉල්ලීමේදී විධිමත් අනුමැතියක් සහිතව ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. එහිදී චක්‍රලේඛවලින් සීමාකර ඇති කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් නොකළ යුතුය.

iv. එසේම, ත්‍රිවිධ හමුදාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා නිල වාහන අනුයුක්ත කිරීමේ දී අනුමත හිමිකමට පමණක් වාහන භාවිතය සීමා කිරීම, නිල හිමිකම සහිත නිලධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන් කිරීම, නිශ්චිතව නියම කර ඇති ඉන්ධන සීමාවක් තුළ භාවිතා කිරීම, අධික ඉන්ධන වියදම සීමා කිරීම සඳහා ක්‍රමවේද භාවිතා කිරීම යනාදිය මගින් තවදුරටත් වියදම් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

06. තවද, මෙම අවුරා තැබීම් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත බැවින් මෙම අදාල ලේඛනයේ දක්වා ඇති අවුරා තැබීම්වල යම් සංශෝධනයක් සිදුවිය යුතු නම් හා තවදුරටත් මාගේ අවධානය යොමු කළ යුතු කරුණක් වේ නම් කඩිනමින් මා වෙත දන්වා එවන මෙන් වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

07. රටේ ජාතික ආරක්ෂාව සහතික කර පවත්වාගෙන යෑමට ආරක්ෂක අංශ විසින් සිදුකරනු ලබන ප්‍රශංසනීය දායකත්වය විශේෂයෙන් අගය කරන අතරම මෙම අතිදුෂ්කර තත්ත්වයෙන් ආර්ථිකය මුදවාගෙන ආර්ථිකමය වශයෙන් බලපෑමට ලක් වූ මහජනතාවට සහන ලබා දෙමින් ඉදිරියට යාම සඳහා ඔබගේ සහයෝගය ඉතා කාරුණිකව අපේක්ෂා කරමි.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:

1. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

# ආරක්ෂක අමාත්‍යාංශය

රු.'000

| වැය ශීර්ෂය හා වියදම් ඒකකය | වැය විෂයය සංකේතාංකය | වැය විෂයය විස්තරය | 2022 වර්ෂයේ ප්‍රතිපාදන | අඩුරා තැබීමට නියමිත ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| 103 – 1- අමාත්‍ය කාර්යාලය | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500 | 300 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500 | 400 |
| 103-2-පරිපාලනය හා ආයතනික සේවා | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5,000 | 1,250 |
| | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,000 | 3,000 |
| | 2003 | වාහන | 10,000 | 5,500 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,000 | 3,500 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,000 | 5000 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 3,000 | 1,700 |
| | 7-2509 | ආරක්ෂක මූලස්ථානය | 12,000,000 | 5,000,000 |
| 103-3- රාජ්‍ය බුද්ධි අංශය | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5,000 | 1000 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,000 | 4000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,000 | 4000 |
| | 2-2103 | ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් | 111,600 | 111,600 |
| 103-4- ශ්‍රී ලංකා ජාතික ශිෂ්‍යභට බලකාය | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 16,000 | 1000 |
| | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800 | 100 |
| | 2003 | වාහන | 6,000 | 1,500 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා | 5,000 | 4000 |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාලීය උපකරණ | | |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,000 | 3,000 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,000 | 200 |
| 103-7-ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 300 | 150 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300 | 225 |
| 103-12-යටිතල පහසුකම් සංවර්ධනය | 1-2201 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 50,000 | 30,000 |
| | 2-2201 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල | 50,000 | 10,000 |
| | 3-2201 | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | 50,000 | 10,000 |
| | 20-2506 | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය | 281,400 | 141,400 |
| | 27-2509 | මානුෂයවාදී සොයා බැලීම් හා මුදවා ගැනීම් සඳහා වන ධාරිතා සංවර්ධනය කිරීම | 25,000 | 11,000 |
| 222-1-සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා | 5-2104 | යුද්ධ හමුදා රෝහල් ව්‍යාපෘතිය | 446,000 | 300,000 |
| | 13-2104 | පනාගොඩ යුද හමුදා කඳවුර තුළ තෙමහල් මධ්‍යම අවි ගබඩා ගොඩනැගිල්ල | 100,000 | 70,000 |
| 222-3-සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 275,000 | 175,000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 850,000 | 590,000 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 400,000 | 300,000 |
| | 4-2103 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම | 500,000 | 500,000 |
| | 6-2101 | ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් | 720,000 | 720,000 |
| | 6-2103 | ජාතික ආරක්ෂාව | 675,000 | 325,000 |

| | | | | |
|---|---|---|---|---|
| | | ශක්තිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් | | |
| | 6-2104 | ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් | 500,000 | 150,000 |
| 223-1- සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා | 1-2104 | නාවික ඇකඩමිය සංවර්ධනය කිරීම | 100,000 | 30,000 |
| 223-2-නාවික මෙහෙයුම් කටයුතු | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 75,000 | 25,000 |
| | 4-2103 | වීඑච්එෆ් යූඑච්එෆ් සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම | 500,000 | 400,000 |
| | 6-2101 | මීටර් 110 ක් දිගැති ගැඹුරු මුහුද නිරීක්ෂණ නෞකාවක් මිලදී ගැනීම | 500,000 | 500,000 |
| | 7-2101 | මීටර් 45 ක් දිගැති වේග මුර සංචාර යාත්‍රා 2ක් මිලදී ගැනීම | 500,000 | 500,000 |
| | 8-2103 | නාවික යාත්‍රාවල විදුලි හා විද්‍යුත් පද්ධතිය වැඩිදියුණු කිරීම | 162,740 | 162,740 |
| | 9-2103 | සංකේතනය රහිත ඉතා උච්ච සංඛ්‍යාත සන්නිවේදන ජාල පද්ධතීන් නවීකරණය කිරීම | 100,000 | 100,000 |
| | 10-2103 | ක්ෂුද්‍ර තරංග සන්නිවේදන ජාලය යාවත්කාලීන කිරීම | 100,000 | 100,000 |
| | 11-2103 | සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු සඳහා විද්‍යුත් දෘෂ්‍ය උපකරණ මිලදී ගැනීම | 500,000 | 500,000 |
| | 13-2103 | යන්ත්‍රෝපකරණ පරීක්ෂණ සහ අත්හදා බැලීම් ඒකකය වැඩිදියුණු කිරීම | 50,000 | 50,000 |
| | 14-2103 | අධිපීඩන ඔක්සිජන් ප්‍රතිකාර කිරීමේ කුටි දෙකක් මිලදී ගැනීම | 135,000 | 135,000 |
| | 16-2506 | දියමත පාවෙන තටාකාංගනයට සමගාමීව නාවික තටාකාංගනයෙහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 25,000 | 25,000 |



RECEIVED 05/01/2015 06:49

| | | | | |
|---|---|---|---|---|
| 223-3-සැපයීම්, තාක්ෂණ සහ සහායක සේවාවන් | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 200,000 | 100,000 |
| | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800,000 | 400,000 |
| | 2003 | වාහන | 300,000 | 100,000 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 150,000 | 120,000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 700,000 | 300,000 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 650,000 | 350,000 |
| | 2108 | කල්බදු වාහන සඳහා ණය මුදල ආපසු ගෙවීම | 41,000 | 41,000 |
| | 2506 | යටිතල පහසුකම් සංවර්ධනය | 150,000 | 80,000 |
| | 1-2104 | උතුරු නැගෙනහිර පළාත්වල නාවික හමුදා කඳවුරු ප්‍රතිස්ථාපනය කිරීම | 7,200 | 700 |
| 224-1- සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 205,000 | 75,000 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 110,000 | 70,000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,500,000 | 2,100,000 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500,000 | 350,000 |
| | 2-2509 | ආදායම් උපයනු ලබන වානිජ ව්‍යාපෘති | 100,000 | 100,000 |
| | 12-2002 | ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් | 1,066,000 | 1,066,000 |
| 320-1-ග්‍රාමාරක්ෂක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 6,000 | 2000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 10,000 | 4000 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 5,000 | 2500 |
| 325-1- සාමාන්‍ය පරිපාලනය සහ | 2102 | ගෘහ භාණ්ඩ හා | 2,000 | 1,000 |

| | | | | |
|---|---|---|---|---|
| ආයතනික සේවා | | කාර්යාලීය උපකරණ | | |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 15,000 | 5000 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 10,000 | 4000 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 15,000 | 10000 |
| 334-1- සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,000 | 2,000 |
| | 2003 | වාහන | 2,500 | 500 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 14,000 | 10,000 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,500 | 4000 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 60,000 | 35,000 |

# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

රු.'000

| වැය ශීර්ෂය හා වියදම් ඒකකය | වැය විෂයය සංකේතාංකය | වැය විෂයය විස්තරය | 2022 වර්ෂයේ ප්‍රතිපාදන | අහුරා තැබීමට නියමිත ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| 442 – 1- අමාත්‍ය කාර්යාලය | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 300 | 200 |
| 442-2- පරිපාලනය හා ආයතනික සේවා (රාජ්‍ය ආරක්ෂක) | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500 | 250 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000 | 500 |
| | 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500 | 250 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 500 | 150 |
| | 1-2201 | රණවිරු සේවා අධිකාරිය | 2,000 | 600 |
| | 2-2201 | ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය | 3,500 | 2,000 |
| | 3-2201 | ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය | 20,000 | 10,000 |
| | 4-2201 | රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 10,000 | 7,000 |
| | 5-2201 | ජාතික ආරක්ෂක විද්‍යායතනය | 10,000 | 6,000 |
| 442-3- පරිපාලනය හා ආයතනික සේවා (අභ්‍යන්තර කටයුතු) | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500 | 250 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800 | 210 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 500 | 250 |
| 442-4- පරිපාලනය හා ආයතනික සේවා (ආපදා කළමනාකරණ) | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500 | 200 |
| 442-5-ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 2003 | වාහන | 1,000 | 500 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 3,000 | 1,000 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,000 | 600 |
| | 2507 | පර්යේෂණ සහ සංවර්ධන | 50,000 | 10,000 |

RECEIVED 05/01/2015 06:49

| | | | | |
|---|---|---|---|---|
| | 1-2509 | ජාතික සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානය | 3,000 | 1,000 |
| 442-02-06- ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය | 1-2201 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | 9,000 | 2,750 |
| | 4-2509 | ශ්‍රී ලංකාව සඳහා බහුවිධ අවදානම් පැතිකඩක් සංවර්ධනය කිරීම | 9,000 | 9,000 |
| | 5-2103 | ගංවතුර සහ නායයෑම් ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයේ ධාරිතාවය ශක්තිමත් කිරීම | 10,000 | 10,000 |
| | 6-2509 | ආපදා අවදානම් අඩු කිරීම සංවර්ධනය සමග ප්‍රධාන ප්‍රවාහ ගත කිරීම | 5,000 | 5,000 |
| 442-02-07- ආපදා සහන මෙහෙයුම් | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,500 | 900 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000 | 850 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,000 | 560 |
| | 1-2509 | ගංවතුර සහ නියං සහනාධාර | 10,000 | 10,000 |
| 304-02-01-කාලගුණ විද්‍යා සේවා | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 5,000 | 1,130 |
| | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 800 | 100 |
| | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 5,000 | 1800 |
| | 2105 | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 5,000 | 1800 |
| | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 2,000 | 440 |

## ආරක්ෂක අමාත්‍යාංශය

රු.'000

| වැය ශීර්ෂය හා වියදම් ඒකකය | වැය විෂයය සංකේතාංකය | වැය විෂයය විස්තරය | 2022 වර්ෂයේ ප්‍රතිපාදන | අහුරා තැබීමට නියමිත ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| 222-1-2 | 1205 | වෙනත් | 4,500,000 | 2,500,000 |
| 223-1-3 | 1205 | වෙනත් | 425,000 | 90,000 |
| 224-1- 1 | 1205 | වෙනත් | 1,600,000 | 1,300,000 |
| 334-1- 1 | 1001 | වැටුප් හා වේතන | 12,525,500 | 6,356,500 |